සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# தென் மாகாணக் கல்வித் திணைக்களம்
# Southern Provincial Department of Education

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ), 12 ශ්‍රේණිය, දෙවන වාර පරීක්ෂණය, 2020 මාර්තු**

**General Certificate of Education (Adv. Level), Grade 12, Second Term Test, March 2020**

**ව්‍යාපාර අධ්‍යයනය - I**

**Business Studies - I**

32 | S | I

පැය 01 යි

**Time: 01 hours**

විභාග අංකය : ....................................................................

**උපදෙස් :**

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.**
- **ප්‍රශ්න අංක 01 සිට 20 තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා, එහි අංකය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.**

01. පහත දැක්වෙන ප්‍රකාශ අතුරින් ඔබට එකග විය හැක්කේ මින් කුමන ප්‍රකාශය සමග ද?

1. වුවමනා ප්‍රාථමික වන අතර අවශ්‍යතා පොදුය.
2. අසීමිත වීම, පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වීම, ව්‍යාපාරිකයන්ට නිර්මාණය කළ හැකිවීම, පුද්ගලබද්ධ වීම අවශ්‍යතාවල ලක්ෂණ කිහිපයකි.
3. සාර්ථක පාරිභෝගිකයකු වීමට නම් ව්‍යාපාර ලෝකය පිළිබඳ හොඳ දැනුමක් තිබීම අත්‍යවශ්‍යය.
4. පාරිභෝගිකයකු භාණ්ඩයක් මිලදී ගැනීමේ දී වඩාත් සැලකිලිමත් වන්නේ ගුණාත්වය හා ඇසුරුම පිළිබඳවය.
5. ව්‍යාපාරවල පැවැත්මට අත්‍යවශ්‍ය ප්‍රධානම සාධකය වන්නේ වෙළෙඳපොළය.

(............)

02. පහත දැක්වෙන්නේ ආර්ථිකයේ විවිධ අංශවලට අයත් ව්‍යාපාර කටයුතු කිහිපයකි.ඒ අතුරින් සේවා අංශයට අයත් ව්‍යාපාර කටයුතු පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.

1. ජාතික ආරක්ෂාව, බහු වාර්ගික බෝග වගාව, රාජ්‍ය පාලනය
2. ප්‍රවාහනය, නවාතැන් සැපයීම, මූල්‍ය රක්ෂණය
3. විදුලිය, ගෑස් හා වායුසමීකරණ සැපයීම
4. කසල කළමනාකරණය, ජලය පිරිසිදු කිරීම, තොග වෙළෙඳාම
5. දේපළ වෙළඳාම්, ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය, මලාපවාහන කටයුතු

(............)

03. ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශව කිහිපයක් පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| A - | අයිතිකරුවෝ | B - | ණයහිමියෝ |
| C - | විභව ආයෝජකයෝ | D - | කළමනාකරුවෝ |
| E - | පාරිභෝගිකයෝ | F - | ප්‍රජාව |
| G - | සේවකයෝ | H - | සැපයුම්කරුවෝ |

ඉහත පාර්ශව අතරින් අභ්‍යන්තර පරිසරය නියෝජනය කරන පාර්ශව ඇතුළත් පිළිතුර වන්නේ,

1. A, E, F
2. A, D, G
3. B, G, H
4. C, D, E
5. A, C, D

(.............)

04. නිල්වලා ගඟේ මැණික් ඉල්ලම් මතුවීම නිසා මිනිසුන් විසින් බලපත්‍ර නොගෙන හොර රහසේ මැණික් ගැරීම සිදු කරයි. මේ නිසා ඔවුන්ගේ ක්‍රය ශක්තිය ද ඉහළ ගොස් ඇත. මෙම සිද්ධියට අදාල සාර්ව පරිසර සාධකවල සම්බන්ධතාව පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

1. ස්වාභාවික පරිසරය, ප්‍රජා පරිසරය, නෛතික පරිසරය, ආර්ථික පරිසරය
2. ස්වාභාවික පරිසරය, නෛතික පරිසරය, ආර්ථික පරිසරය
3. ආර්ථික පරිසරය, තාක්‍ෂණික පරිසරය, ප්‍රජා පරිසරය, නෛතික පරිසරය
4. ස්වාභාවික පරිසරය, සමාජ හා සංස්කෘතික පරිසරය, ආර්ථික පරිසරය, නෛතික පරිසරය
5. නෛතික පරිසරය, දේශපාලන පරිසරය, ආර්ථික පරිසරය, ප්‍රජා පරිසරය

(.............)

05. වර්තමානයේ ව්‍යාපාර වර්ධනය ළඟාකර ගැනීමේ දී සම්පත් අරපිරිමැස්මෙන් මෙන්ම අනාගතය සඳහා සම්පත් ඉතිරිකරමින් පරිසරය සුරැකෙන ලෙස කටයුතු කළයුතු බව ''සිරිලක් ව්‍යාපාරයේ'' අයිතිකරු වන ලක්ප්‍රිය ප්‍රකාශ කරයි. ඔහුගේ මෙම ප්‍රකාශය සමස්ථ රටක් ලෙස ගත්කල හැඳින්විය හැක්කේ,

1. ආර්ථික වර්ධනය හා සංවර්ධනය ලෙසයි.
2. තිරසර සංවර්ධනය හෙවත් ධරණීය සංවර්ධනය ලෙසයි.
3. පරිසර හිතකාමී ධරණීය සංවර්ධනය ලෙසයි.
4. ආර්ථික හා සමාජ සංවර්ධනය ලෙසයි.
5. කාර්යක්‍ෂමතාව හා පාරිසරික සංවර්ධනය ලෙසයි.

(.............)

06. ව්‍යාපාරයක් විසින් එක් එක් පාර්ශව වෙත ඉටුකළ යුතු සමාජ වගකීම් ලැයිස්තුවක් පහත දැක්වේ.

A - රැකියා නියුක්තියට දායක වීම
B - ආර්ථික ප්‍රතිලාභ
C - වෘත්තීයමය ආරක්‍ෂාව
D - බදු ගෙවීම නොපිරිහෙලා ඉටු කිරීම
E - අයිතිවාසිකම් ආරක්‍ෂා කිරීම
F - කාර්යක්‍ෂම හා අවංක ලෙස කළමනාකරණ කටයුතු මෙහෙයවීම

ඉහත සමාජ වගකීම් අතුරින් සමාජය වෙනුවෙන් ඉටුකළ යුතු සමාජ වගකීම් ඇතුලත් පිළිතුර තෝරන්න.

1. A හා B
2. D හා E
3. B හා C
4. A හා D
5. C හා E

(.............)

07. ව්‍යාපාර කටයුතු පාලනය කිරීම සඳහා රජයේ මැදිහත්වීම අවශ්‍ය වන්නේ,

1. රාජ්‍ය අංශයේ ව්‍යාපාර ආරක්‍ෂා කිරීමට
2. ව්‍යාපාර අතර තරඟකාරීත්වය ඇති කිරීමට
3. රජයට ආදායමක් උපයා ගැනීම සඳහා
4. රටේ දළ ජාතික නිෂ්පාදිතය ඉහළ නැංවීම සඳහා
5. මහජනතාවගේ සුභසිද්ධිය සඳහා

(.............)

08. සෘජු බදු පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.

1. ප්‍රාග්ධන ලාභමත බදු, රේගු බදු, නිෂ්පාදන බදු, සමාගම් බදු, සෙස් බදු
2. රඳවාගැනීමේ බදු, සමාගම් බදු, පුද්ගල ආදායම් බදු, ප්‍රාග්ධන ලාභමත බදු
3. උපයන විට ගෙවීම් බදු, රේගු බදු, විදුලි සංදේශ බදු, නිෂ්පාදන බදු
4. වරාය හා ගුවන්තොටුපල සංවර්ධන බදු, සුරා බදු, එකතු කළ අගයමත බදු, රේගු බදු
5. රඳවාගැනීමේ බදු, පුද්ගල ආදායම් බදු, එකතු කළ අගයමත බදු, වරිපනම් බදු

(.............)

09. පහත දැක්වෙන්නේ රජයේ පිස්කල් ප්‍රතිපත්තියට හා මූල්‍ය ප්‍රතිපත්තියට අයත් අංග කිහිපයකි.

A - පොළී අනුපාතය ඉහළ දැමීම
B - තෝරාගත් ආනයන වර්ග සඳහා තීරුබදු සහන ලබාදීම
C - පොහොර සහනාධාර ලබාදීම
D - වාණිජ බැංකුවල ප්‍රාග්ධනය හා වත්කම් අතර අවම අනුපාතය නියම කිරීම
E - විවට වෙළෙඳපොළ කටයුතු
F - රජය යටිතල පහසුකම් සඳහා වියදම් දැරීම

මේවා අතරින් පිස්කල් ප්‍රතිපත්තියට අයත් අංග පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.

1. A, C, D
2. B, C, F
3. D, E, F
4. B, C, D
5. A, B, E

(.............)

10. කේවල ස්වාමි ව්‍යාපාරයක් හා සසඳන කල හවුල් ව්‍යාපාරයකට ආවේනික වූ විශේෂ වාසියක් ලෙස පිළිගත හැක්කේ,

1. ව්‍යාපාරික තොරතුරු වල රහස්‍යභාවය ආරක්‍ෂා වීම
2. වගකීම් බෙදීයාම
3. පහසුවෙන් ආරම්භ කළ හැකිවීම
4. තීරණ ඉක්මනින් ගත හැකිවීම
5. පහසුවෙන් විසුරුවිය හැකිවීම

(.............)

11. සංස්ථාපිත සමාගම් සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත වේ.

A - විශාල ප්‍රාග්ධනයක් රැස්කර ගැනීම
B - ලාභ ඉපැයීම
C - සමාජීය පොදු අවශ්‍යතා
D - සීමිත වගකීම
E - අඛණ්ඩ පැවැත්මක් තිබීම

ඉහත කරුණු අතරින් සංස්ථාපිත සමාගම් බිහිවීමට බලපා ඇති හේතු ඇතුලත් කාණ්ඩය වනුයේ,

1. A, B, D
2. C, D, E
3. A, D, E
4. B, C, D
5. B, D, E

(.............)

12. පහත දැක්වෙන්නේ ව්‍යාපාර සංවිධාන කිහිපයක් හා ඒවාට අදාල කරුණු කිහිපයකි.

| ව්‍යාපාර සංවිධාන | අදාල කරුණු |
|---|---|
| 1. හවුල් ව්‍යාපාර | A. කොටස් නිකුත් කිරීමක් සිදු නොවේ |
| 2. සමූපකාර | B. ලාභාංශ ගෙවීමට පෙර ණය ගෙවීමේ හැකියාව පිළිබඳ පරීක්ෂණයක් කළ යුතුය |
| 3. රාජ්‍ය සංස්ථා | C. අවම වශයෙන් සාමාජිකයන් දෙදෙනෙකුවත් සිටිය යුතු වීම |
| 4. සී/ස පොදු සමාගම් | D. ප්‍රජාතන්ත්‍රවාදී බව |
| 5. ඇපයෙන් සීමිත සමාගම් | E. පොදු හෝ විශේෂ පාර්ලිමේන්තු පනතක් යටතේ අරඹයි |

ඉහත ව්‍යාපාර සංවිධාන වලට අදාල වන කරුණු පිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ,

1. BCDFE
2. ABDCF
3. ADCBF
4. CDEBA
5. DEBCA

(.............)

13. රජයේ දෙපාර්තමේන්තුවක් ලෙස ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමේ දී සාමාන්‍යයෙන් මුහුණ පෑමට සිදුවන ගැටලු කිහිපයක් පහත වේ.

A - ලාභලාභ රජය විසින් විඳ දරාගැනීම
B - ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි වැනි රජයේ ප්‍රතිපත්ති වලට අනුව කටයුතු කළ යුතු වීම නිසා තීරණ ගැනීම ප්‍රමාද වීම
C - අරමුදල් සම්පාදනය සම්බන්ධයෙන් සීමා පනවා තිබීම
D - නිලධාරි ක්‍රමයක් පවතින නිසා කළමනාකරණය නම්‍ය නොවීම
E - පූර්ණ රාජ්‍ය හිමිකමක් දැකිය හැකි වීම

ඉහත ප්‍රකාශ වලින් වඩාත් නිවැරදි ප්‍රකාශයන් වන්නේ,

1. BCD
2. ABC
3. BDE
4. ADE
5. CDE

(.............)

14. ව්‍යාපාර අධ්‍යයනය විෂය හදාරන සිසුන් කිහිපදෙනෙකුගෙන් ව්‍යවසායකයා යන්නට නිවැරදි පිළිතුරක් අපේක්ෂාවෙන් විමසූ ප්‍රශ්නයට ඔවුන් ලබාදුන් පිළිතුරු අතරින් වඩා නිවැරදි පිළිතුර විය හැක්කේ,

1. ඕනෑම අවදානමක් දරන්නකු ව්‍යවසායකයකු වේ.
2. කිසියම් ක්‍රියාවකට ප්‍රතික්‍රියා දක්වන්නකු ව්‍යවසායකයකු වේ.
3. ව්‍යාපාරවල වෙනස්වීම් සිදුකරන්නා ව්‍යවසායකයෙකි.
4. ව්‍යාපාරය කළමනාකරණය කරන්නා ව්‍යවසායකයෙකි.
5. ප්‍රායෝගික අදහස් තුළින් නව්‍යතා බිහිකරන්නා ව්‍යවසායකයෙකි.

(.............)

15. පහත දැක්වෙන ලේඛනයේ සඳහන් අර්ථ දැක්වීම හා ඊට අදාළ සංකල්පය නිවැරදිව ගලපන්න.

| අර්ථ දැක්වීම | සංකල්පය |
|---|---|
| 1. නවෝත්පාදන සඳහා කාන්තා දායකත්වය ඉහළ යාම | a. සමාජ ව්‍යවසායකත්වය |
| 2. ලාභ අරමුණින් තොරව සිදුකරන ව්‍යවසායකත්වය | b. නිර්මාණශීලීත්වය |
| 3. පවතින තත්ත්වයට වඩා උසස් ලෙස භාණ්ඩ නිපදවීමේ හැකියාව | c. අවධානම් දැරීම |
| 4. ලෝකයාට අලුත් දෙයක් ඉදිරිපත් කිරීම | d. කාන්තා ව්‍යවසායකත්වය |
| 5. නිශ්චිත මිලකට ගත් භාණ්ඩ අවිනිශ්චිත මිලකට විකිණීම | e. නවෝත්පාදනය |

1. a , b , c , d , e
2. a , b , e , d , c
3. d , e , b , a , c
4. b , d , c , a , e
5. d , a , b , e , c

(.............)

16. ව්‍යවසායකත්ව ගති ලක්ෂණයක් ලෙස පිළිගත නොහැක්කේ මින් කුමක් ද?

1. අවධානම් දැරීමට ඇති කැමැත්ත
2. නිර්මාණශීලී බව
3. කැපවීම
4. පරිකල්පනික චින්තනය
5. ආත්ම විශ්වාසය

(.............)

17. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හඳුනා ගැනීම සඳහා නිර්ණායකයක් වශයෙන් භාවිතා කරන විදුලිබල ධාරිතාව යොදා ගනු ලබන්නේ,

1. ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව
2. කාර්මික තාක්‍ෂණික ආයතනය
3. ශ්‍රී ලංකා මහ බැංකුව
4. කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශය
5. කාර්මික සංවර්ධන මණ්ඩලය

(.............)

18. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

1. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල සාර්ථකත්වයට ව්‍යවසායකත්වය ඉවහල් වේ.
2. ව්‍යාපාරයේ කළමනාකරණ කටයුතු ස්වාධීනය.
3. විශාල ව්‍යාපාරවලට සාපේක්‍ෂව මෙම ව්‍යාපාරවල මූල්‍ය බැඳීම් වැඩිය.
4. ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හඳුනා ගැනීම සඳහා නිර්ණායකයක් ලෙස සේවක සංඛ්‍යාව යොදා ගනියි.
5. කර්මාන්ත පිළිබඳ පුරුද්දක් නොමැති වීම කුඩා ව්‍යාපාර අසාර්ථක වීමට හේතුවකි.

(.............)

19. ''නවකතා රචකයකු වූ ප්‍රියංකර ඔහු විසින් රචනා කරන ලද නවකතාව රු.1000 කට මිල කර ඇත.''මෙම ප්‍රකාශය තුළින් කියවෙන්නේ මින් කුමන කාරණය පිළිබඳව ද?

1. මුදල්වලට පොදු පිළිගැනීමක් ඇති බවය.
2. මුදල් විලම්බිත ගෙවුම් මාධ්‍යක් බවය.
3. මුදල් වටිනාකමේ මිම්මක් බවය.
4. මුදල් වටිනාකමේ සන්නිධියක් බවය.
5. මුදල් හුවමාරු මාධ්‍යක් බවය.

(.............)

20. මුදල් සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රකාශ අතුරින් එකක් වැරදිය.එය කුමක් ද?

1. ණය කාඩ්පත් හා හර කාඩ්පත් මුදල් ආදේශක වේ.
2. රටක වලංගු මුදල් සඳහා පොදු පිළිගැනීමක් අවශ්‍ය වේ.
3. වාණිජ බැංකු වල මහජනයා පවත්වාගෙන යන ජංගම ගිණුම්වල ශේෂ බැංකු මුදල් වේ.
4. අනාගත ගෙවීමක් සඳහා වර්තමානයේ නිෂ්පාදිත ලබාගෙන අනාගතයේ ගෙවීම් කළ හැකිය.
5. ආසන්න මුදල් වලංගු මුදල් මෙන් 100% ක් ද්‍රවශීලතාවයෙන් යුක්තය.

(............)

(ල.1x20)

- **ප්‍රශ්න අංක 21-25 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.**

21\. ආ) තිරසර සංවර්ධනය ගොඩනැගී ඇත්තේ ආර්ථික තිරසර සංවර්ධනය ............................................................ හා ................................................................ මතය.

ආ) පරිසරය සුරැකීම, රැකියා අවස්ථා මත ව්‍යාපාර කෙරෙහි ඇල්මක් දක්වන්නේ .......................................... වන අතර අනාගතයේ තම සම්පත් ආයෝජනය මත ඇල්මක් දක්වන්නේ ........................................ වේ.

22\. අ) රජයක ආර්ථික අරමුණු ඉටුකර ගැනීම සඳහා ................................................ හා ............................................ වෙනුවෙන් වර්ෂයක් තුළ දී කරනු ලබන මුළු වියදම ........................................................ වේ.

ආ) රාජ්‍ය අයවැය ලේඛනය මඟින් ..................................................................................... පිළිඹිබු වේ.

23\. සිය ආර්ථික, සමාජීයීය හා සංස්කෘතිකමය අවශ්‍යතා හා අපේක්ෂා ඉටුකර ගැනීම උදෙසා .................... ......................එක්සත් වූ පුද්ගලයන්ගේ ................................. සංගමයක් මෙන්ම .......................................... අයිතිය සහිත................................................... ලෙස පාලනය වන ව්‍යාපාරයක් සමූපකාර ව්‍යාපාරය ලෙස හඳුන්වයි.

24\. අ) ව්‍යවසායකත්වය ක්‍රියාවලියේ පියවරක් වන සංකල්ප ගොඩනැගීම හා ව්‍යාපාර සැලැස්ම සැකසීම මඟින් ........................................................... පැහැදිලි කෙරේ. සමාජීය මෙහෙවරක් ඉටුකිරීමේ චේතනාවෙන් සමාජීය ගැටළු වලට පිළියම් යෙදීමට නවෝත්පාදනයේ යෙදීම ...............................................වේ.

ආ) නව රැකියා අවස්ථා උත්පාදනය වීම ව්‍යවසායකත්වය තුළින් ඇතිවන ..................................................... ප්‍රතිලාභයක් වන අතර සමාජ තත්වය හා පිළිගැනීම ඇතිවීම ...................................................... ප්‍රතිලාභයකි.

25\. අ) වාණිජ බැංකුවක් විසින් සපයන ප්‍රධාන සේවාවන් ලෙස ................................................................. හා ............................................................ දැක්විය හැකිය.

ආ) ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණු වන්නේ....................................................................................... හා ......................................................................................... වෙයි.

(ල.2x5)

- **26-30 තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉරි මත ලියන්න.**

26. ව්‍යාපාරයක් ආර්ථික තිරසර බව වෙනුවෙන් කටයුතු කරන විට අවධානය යොමු කළ යුතු කරුණු හතරක් ලියන්න.

    1) ..............................................................................................................................................

    2) ..............................................................................................................................................

    3) ..............................................................................................................................................

    4) ..............................................................................................................................................

27. රජයේ බදු නොවන ආදායම් වර්ග හතරක් නම් කරන්න

    1) ..............................................................................................................................................

    2) ..............................................................................................................................................

    3) ..............................................................................................................................................

    4) ..............................................................................................................................................

28. හවුල් ව්‍යාපාර සම්බන්ධයෙන් පහත කාර්යයන්ට අදාළ නීති ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.

    1) රුපියල් 1000 ට වැඩි ප්‍රාග්ධනයක් යෙදීම ........................................................................

    2) ලාභ අලාභ බෙදා ගැනීම ........................................................................

    3) උපරිම හවුල්කරුවන් ගණන ........................................................................

    4) තම නමින් හැර වෙනත් නමකින් පවත්වා ගෙනයාම ........................................................................

29. විද්‍යුත් මුදල් ගනුදෙනු පහසු කිරීම සඳහා සපයනු ලබන සේවාවන් හතරක් ලියන්න.

    1) ..............................................................................................................................................

    2) ..............................................................................................................................................


    3) ..............................................................................................................................................

    4) ..............................................................................................................................................


30. පහත සඳහන් එක් එක් සංකේතයේ අදහස ලියන්න.

    1) 

    ........................................................................

    2) 


    ........................................................................

3) 

..............................................................

4)

..............................................................

(ල.2x5)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# தென் மாகாணக் கல்வித் திணைக்களம்
# Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ), 12 ශ්‍රේණිය, දෙවන වාර පරීක්ෂණය, 2020 මාර්තු

**General Certificate of Education (Adv. Level), Grade 12, Second Term Test, March 2020**

**ව්‍යාපාර අධ්‍යයනය - II**

**Business Studies - II**

32 | S | II

පැය 02 යි

**Time: 02 hours**

විභාග අංකය : ....................................................................

**සැලකිය යුතුයි :**

- **ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.**

01) i. වර්තමානයේ සීඝ්‍ර දියුණුවක් ලබා ඇති ව්‍යාපාරයක හිමිකරුවෙකු වන ප්‍රදීප් නමැති ව්‍යාපාරිකයා නිරන්තරයෙන් තම සේවකයන්ට උපදෙස් ලබා දෙන්නේ පාරිභෝගිකයන්ගේ වුවමනා පිළිබඳව අවධානය යොමු කරන ලෙසය. මිනිස් අවශ්‍යතා පිළිබඳ සැලකිල්ල යොමු කරමින්ඉහත ප්‍රකාශනය සම්බන්ධයෙන් ඔබගේ අදහස් දක්වන්න. (ල.04)

ii. අ) විද්‍යුත් වාණිජ්‍යය හා විද්‍යුත් ව්‍යාපාර යන සංකල්ප පැහැදිලි කරන්න. (ල.02)

ආ) විද්‍යුත් වාණිජ්‍යය මගින් ව්‍යාපාරවලට හා ගනුදෙනුකරුවන්ට ලැබිය හැකි ප්‍රතිලාභ 02 ක බැගින් සඳහන් කරන්න. (ල.02)

iii. නූතන ව්‍යාපාර ලෝකයේ දැකිය හැකි නව ප්‍රවනතා 04 ක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.04)

iv. ව්‍යාපාර සාර්ථක වීමට නම් තම පරිසරය පිළිබඳ අධ්‍යයනය කළ යුතුය. එසේ පරිසර විශ්ලේෂණයක් කිරීමේ දී ව්‍යාපාර ශුද්‍රත විශ්ලේෂණයක් යොදාගනු ලබයි. එවැනි ශුද්‍රත විශ්ලේෂණයකින් ව්‍යාපාරයකට ලැබිය හැකි ප්‍රයෝජන ලියන්න. (ල.04)

v. ව්‍යාපාරවල සාර්ව පරිසරයේ ක්‍රියාත්මක වන පරිසර බලවේග කිහිපයක් පහත දැක්වේ. එම පරිසර බලවේග ව්‍යාපාර කෙරෙහි ඇති කරන බලපෑම් උදාහරණ සහිතව විස්තර කරන්න.

1. ප්‍රජා පරිසරය
2. ගෝලීය පරිසරය
3. ආර්ථික පරිසරය
4. තාක්ෂණික පරිසරය (ල.04)

02) i. එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් සමාජ වගකීම් ලෙස ප්‍රමුඛතාවය ලබාදිය යුතු අංශ හතරක් දක්වා ඇත. එම අංශ හතර නම් කර එම අංශ වෙත ඉටුවිය යුතු වගකීම් 02 ක බැගින් සඳහන් කරන්න.

(ල.04)

ii. පාසල් ශිෂ්‍යයෙකු වශයෙන් ඔබ පාසල තුළදීත් පාසලින් පිටතදීත් පිළිපැදිය යුතු ආචාරධර්ම 04 බැගින් ලියන්න. (ල.04)

iii. ව්‍යාපාරවල කටයුතු සාර්ථක කර ගැනීම සඳහා රජය ව්‍යාපාරවලට විවිධාකාරයෙන් බලපෑම් කරනු ලබයි. එවැනි බලපෑම් 04 ක් සඳහන් කර පැහැදිලි කරන්න. (ල.04)

iv. අ) රජයේ ආර්ථික අරමුණක් ලෙස ආර්ථික ස්ථායීතාවය හැඳින්විය හැකිය. ආර්ථික ස්ථායීතාව අභ්‍යන්තර මිල ස්ථායීතාවය හා බාහිර මිල ස්ථායීතාවය වශයෙන් කොටස් දෙකකට බෙදිය හැකිය. එම කොටස් දෙක මඟින් සිදුවන්නේ කුමක් දැයි වෙන වෙනම ලියා දක්වන්න. (ල.02)

ආ) රජයෙන් ව්‍යාපාරවලට ලැබෙන සහාය හා මගපෙන්වීම වැදගත් වන ආකාර 04 ක් සඳහන් කරන්න. (ල.02)

v. අ) පාරිභෝගික ආරක්ෂණය ව්‍යාපාරිකයාට වැදගත් වන්නේ කෙසේ දැයි හේතු 04 ක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල.02)

ආ) ''වෙළෙඳ ආයතනයකට පැමිණි තරුණයෙක් ස්වාභාවික පළතුරු පානයක් වෙළෙඳසැලෙහි අලෙවිකරුගෙන් ඉල්ලා සිටියේය. එවිට අලෙවිකරු එම ආයතනයේ තිබූ ලේබලය අපවිත්‍ර වූ විදේශ රටකින් ආනයනය කරන ලද කෘතිම පළතුරු පානයක් ඔහුට ලබාදුනි. එම පළතුරු පානයෙහි අඩංගු ද්‍රව්‍ය හා ප්‍රමිතිය පිළිබඳව ද කිසිවක් සඳහන් වී නොතිබුණි. එම පළතුරු පානය මිලදී ගැනීම තරුණයා විසින් ප්‍රතික්ෂේප කළ ද අලෙවිකරු එය මිලදී ගන්නා ලෙස බලකර සිටියේය. ඉහත සිද්ධියට අනුව උල්ලංඝනය වී ඇති පාරිභෝගික අයිතිවාසිකම් මොනවාදැයි සිද්ධිය ඇසුරින් උදාහරණ සහිතව දක්වන්න. '' (ල.02)

03) i. පහත සඳහන් නිර්ණායක යටතේ කේවල ස්වාමි ව්‍යාපාර හා හවුල් ව්‍යාපාර තුලනාත්මකව සසඳන්න.

i. සාමාජික සංඛ්‍යාව

ii. පරිපාලනය

iii. තීරණ ගැනීම

iv. විසුරුවා හැරීම (ල.1x4)

ii. අ) තනිපුද්ගල ව්‍යාපාරයක් පවත්වාගෙන යන ලද සුනිමල්, සුනිල් හා කමල් යන මිතුරන් දෙදෙනෙක් ව්‍යාපාරික කටයුතුවලට එකතු කරගෙන සී/ස පෞද්ගලික සමාගමක් ලෙස සංස්ථාපනය කිරීමට අපේක්ෂාවෙන් සිටියි. සුනිමල් තනි ව්‍යාපාරයක් ලෙස තම ව්‍යාපාරය තවදුරටත් පවත්වාගෙන යනවාට වඩා සී/ස පෞද්ගලික සමාගමක් ලෙස සංස්ථාපනය කිරීම මඟින් අපේක්ෂා කරනු ලබන වාසි 04 ක් සඳහන් කරන්න. (ල.02)

ආ) කුසුම්, කුමාරි හා රේණුකා යන අය විසින් ලිඛිත ගිවිසුමකින් පවත්වාගෙන ගිය හවුල් ව්‍යාපාරයෙන් කුමාරි ඉවත්වුණි. ඉන්පසු අනෙක් හවුල්කරුවන් දෙදෙනාට හවුල් ව්‍යාපාරය දිගටම පවත්වාගෙන යාහැකිවේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න. (ල.02)

iii. ''සුනිල් සහ සමාගම'' යන ව්‍යාපාරය අයත් වන්නේ කවර ව්‍යාපාර සංවිධානයකට දැයි නම් කර එම ව්‍යාපාරය සම්බන්ධව පහත සඳහන් දෑ කවර ස්වභාවයක් ගනීදැයි පැහැදිලි කරන්න.

i. පැවැත්ම

ii. බදු ගෙවීම

iii. ණයහිමියන් කෙරෙහි බැදීම (ල.04)

iv. වරලත් ව්‍යාපාර ආරම්භ කිරීමේ දී වරලත්ලාභියා හා වරලත්හිමියා අතර ඇතිවන ගිවිසුම වරලත්ගිවිසුම නම් වේ.

අ) වරලත් ගිවිසුම අනුව වරලත්හිමියා විසින් වරලත්ලාභියාට සපයන පහසුකම් මොනවා ද? (ල.02)

ආ) වරලත් ගිවිසුම අනුව වරලත්ලාභියා විසින් ඉටුකල යුතු කාර්යයන් මොනවා ද? (ල.02)

v. ''රාජ්‍ය අංශයට අයත් ව්‍යාපාර සංවිධාන අතුරින් රාජ්‍ය සමාගම්, රාජ්‍ය සංස්ථාවලට වඩා ව්‍යාපාර තරඟකාරීත්වයට මුහුණ දීමට යෝග්‍ය වේ.'' මෙම ප්‍රකාශය පිළිබඳ ඔබේ අදහස් දක්වන්න. (ල.04)

04) i. රටක ව්‍යවසායකත්වය එහි ආර්ථික සංවර්ධනයට බෙහෙවින් බලපාන සාධකයකි. ව්‍යවසායකත්වය හා ආර්ථික සංවර්ධනය අතර ඇති සම්බන්ධතාවය පැහැදිලි කර ව්‍යවසායකත්වය ආර්ථික සංවර්ධනය වේගවත් වීමට බලපාන ආකාරය පැහැදිලි කරන්න. (ල.04)

ii. අ) ''වර්තමානයේ ව්‍යවසායකත්වයේ අවශ්‍යතාව වඩාත් ඉස්මතු වී තිබේ.'' මෙම ප්‍රකාශය හා ඔබට එකඟ විය හැකි ද? ඔබේ පිළිතුර සනාථ කිරීමට කරුණු 04 ක් ඉදිරිපත් කරන්න. (ල.1/2x4=2)

ආ) ව්‍යවසායකත්ව ගතිලක්ෂණ හා කුසලතා වර්ධනය කරගත හැකි ආකාර මොනවාදැයි දක්වන්න. (ල.1/2x4=2)

iii. අ) ව්‍යවසායකත්වය යනු තනි ක්‍රියාවක් නොව ක්‍රියාකාරකම් සමූහයකින් යුත් ක්‍රියාවලියකි. ව්‍යවසායකත්ව ක්‍රියාවලියේ ප්‍රධාන පියවර පිළිවෙළින් නම් කරන්න. (ල.02)

ආ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සෙසු ව්‍යාපාර වලින් වෙන් කර හඳුනාගැනීම අත්‍යවශ්‍ය වන්නේ ඇයි දැයි හේතු දක්වන්න. (ල.02)

iv. අ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර බොහෝමයක් අසාර්ථක වීමට හේතු මොනවා ද? (ල.02)

අ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වලට දිරිගැන්වීම් ලබා දෙන රාජ්‍ය නොවන ආයතන මොනවාදැයි නම් කරන්න. (ල.02)

v. අ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා තාක්ෂණික, මූල්‍ය, අලෙවි හා උපදේශන පහසුකම් සපයන ආයතනය බැගින් දක්වන්න. (ල.02)

අ) මාලිත අ.පො.ස උසස් පෙළින් පසු සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අදහස් කරගෙන සිටියි. ඔහුට එම ව්‍යාපාරය ආරම්භ කිරීමේ දී හා පවත්වාගෙන යාමේ දී සැලකිලිමත් වීමට සිදුවන කරුණු මොනවා ද? (ල.02)

05) i. අ) හොඳ මුදලක පැවතිය යුතු ලක්ෂණ 04 ක් සඳහන් කරන්න. (ල.02)

ආ) මුදලේ කාර්යයන් හඳුන්වන්න. (ල.02)

ii. අ) බලපත්‍රලාභී වාණිජ බැංකුවක් බලපත්‍රලාභී විශේෂිත බැංකුවකින් වෙනස් වන්නේ කෙසේද යන්න සඳහන් කරන්න. (ල.02)

ආ) ලියාපදිංචි මූල්‍ය සමාගම්වල කාර්යයන් 02 ක් හා බලපත්‍රලාභී විශේෂිත බැංකුවක කාර්යයන් 02 ක් සඳහන් කරන්න. (ල.02)

iii. අ) ඒකකභාරයක් යන්න හඳුන්වා ඒකකභාරයකට සම්බන්ධ පාර්ශව සඳහන් කරන්න. (ල.02)

ආ) ගිවිසුම් ගත ඉතිරිකිරීමේ ආයතන 04 ක් ලියන්න. (ල.02)

iv. අ) ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යයන් 04 ක් සඳහන් කරන්න. (ල.02)

ආ) ව්‍යාපාරවල සාර්ථකත්වයට මහ බැංකුවේ කටයුතු ඉවහල් වන ආකාරය උදාහරණ මඟින් පැහැදිලි කරන්න. (ල.02)

v. වාණිජ බැංකුවක් පවත්වාගෙන යන විවිධ තැන්පතු වර්ග නම්කර ඒවා වෙන් වෙන්ව පැහැදිලි කරන්න. (ල.04)

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## දෙවන වාර පරීක්ෂණය - 2020

## 12 ශ්‍රේණිය

## ව්‍යාපාර අධ්‍යනය පිළිතුරු

## I පත්‍රය

| | | |
|---|---|---|
| 01 - 3 | 11 - 3 | **21.** අ) පරිසර තිරසර ආරක්ෂණය, සමාජ තිරසර සංවර්ධන |
| 02 - 2 | 12 - 4 | ආ) ප්‍රජාව, විභව ආයෝජකයින් |
| 03 - 2 | 13 - 1 | **22.** අ) වර්තන වියදම්, ප්‍රාග්ධන වියදම්, රාජ්‍ය වියදම් |
| 04 - 1 | 14 - 5 | ආ) රජයේ පිස්කල් ප්‍රතිපත්තිය |
| 05 - 3 | 15 - 5 | **23.** ස්වේච්ඡාවෙන්, ස්වාධීන, සාමූහික, ප්‍රජාතන්ත්‍රවාදී |
| 06 - 4 | 16 - 4 | **24.** අ) ව්‍යාපාර අදහස, සමාජීය ව්‍යවසායකත්වය |
| 07 - 5 | 17 - 3 | ආ) සමාජ හා ආර්ථික, පුද්ගල |
| 08 - 2 | 18 - 3 | **25.** අ) තැන්පතු ආශ්‍රිත සේවා, ණය ආශ්‍රිත සේවා |
| 09 - 2 | 19 - 3 | ආ) ආර්ථික හා මිල ස්ථායීතාව පවත්වාගෙන යාම, |
| 10 - 2 | 20 - 5 | මූල්‍ය ක්‍රමයේ ස්ථායීතාව පවත්වාගෙන යාම |
| | **(ල.1x20=20)** | **(ල.2x5=10)** |

**26.** 1. ආර්ථික වර්ධනය හා ස්ථායීතාව
2. කාර්යක්ෂමතාවය
3. තරඟකාරීත්වය
4. නිෂ්පාදනය හා පාරිභෝජනය
5. සේවා නියුක්තිය
6. අන්තර්ජාතික වෙළෙඳාම

**27.** 1. ලාභ හා ලාභාංශ
2. ගාස්තු හා අයකිරීම්
3. පොළී ආදායම්
4. වෙනත් ආදායම්

**28.** 1. 1840 වංචා වැලැක්වීමේ ආඥාපනත
2. 1890 හවුල් ව්‍යාපාර ආඥාපනත
3. 2007 අංක 07 සමාගම් පනත
4. 1918 අංක 06 දරණ ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ ආඥාපනත

**29.** 1. ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATM)
2. ස්වයංක්‍රීය තැන්පතු යන්ත්‍ර (ADM)
3. චෙක්පත් තැන්පතු යන්ත්‍ර (CDM)
4. වෙළෙඳසැල් ගෙවීම් විද්‍යුත් පැවරුම් ජාල
5. ටෙලි බැංකු පහසුකම්
6. අන්තර්ජාල බැංකු පහසුකම්
7. ටෙලිවිෂන් බැංකු පහසුකම්

**30.** 1. මධ්‍යම පරිසර අධිකාරිය
2. මාංශ සහිත ආහාරයකි/ නිර්මාංශ ආහාරයක් නොවේ
3. රෝල් කරන්න එපා
4. Messenger

**(ල.2x5=10)**

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**දෙවන වාර පරීක්ෂණය - 2020**

**12 ශ්‍රේණිය**

**ව්‍යාපාර අධ්‍යනය පිළිතුරු**

**II පත්‍රය**

01) i. මෙම ව්‍යාපාරිකයා පාරිභෝගිකයාගේ වුවමනා පිළිබඳ වඩා වැඩි අවධානයක් යොමු කරන්නේ අවශ්‍යතා මිනිසාට පොදු බවත් ඒවා ඉටු කර ගැනීමට නම් වුවමනා පිළිබඳ සැලකිල්ලක් දැක්විය යුතු බවත් ඒවා ඉටු කිරීමට නිරන්තරයෙන් සූදානමින් සිටිය යුතු බවත්ය. වුවමනා ප්‍රවර්ධනය කළ හැකි වන අතර අවශ්‍යතා ප්‍රවර්ධනය කළ නොහැකිය. ප්‍රවර්ධනය කලත් වුවමනා වෙනස් කළ හැකි නිසා වුවමනා කෙරෙහි වැඩි සැලකිල්ලක් යොමු කළ යුතු වේ.

**(ල.04)**

ii. අ) අන්තර්ජාලය පදනම් කර ගනිමින් භාණ්ඩ හා සේවා විකිණීම, මිලදී ගැනීම හා ගෙවීම් කිරීම විද්‍යුත් වාණිජ්‍යය යන්නෙන් අදහස් කෙරේ. අන්තර්ජාලය හරහා භාණ්ඩ මිලට ගැනීම හා විකිණීම හා ඊට අදාළ පෙර සහ පසු සියළු කටයුතු විද්‍යුත් ව්‍යාපාර වේ.

**(ල.02)**

ආ) ව්‍යාපාර වලට
1. පිරිවැය අඩු වීම
2. ගණුදෙනු ප්‍රමාණය වැඩි වීම **(ල.01)**

ගණුදෙනුකරුට
1. ඉතා ඉක්මණින් ලබා ගත හැකි වීම
2. භාණ්ඩ වල මිල අඩු වීම **(ල.01)**

iii.
1. දැඩි තරඟකාරීත්වය
2. පාරිසරික බලපෑම් වැඩි වීම
3. ගණුදෙනුකරුවන් ප්‍රබල වීම
4. දේශපාලන හා ආර්ථික අස්ථාවරභාවය
5. පාරිභෝගික දැනුවත්භාවය ඉහළ යාම
6. පරිසර සංරක්ෂණය පිළිබඳ බලපෑම

(වෙනත් ප්‍රවනතා ගැන ද සලකා විස්තර කිරීම් සහිත පිළිතුරුවලට ලකුණු දෙන්න) **(ල.1x4=4)**

iv.
1. ව්‍යාපාරය සතු ශක්තීන් හඳුනා ගැනීම හා ව්‍යාපාරයේ සාර්ථකත්වයට එම ශක්තීන් යොදා ගැනීම.
2. ව්‍යාපාරයේ දුර්වලතා හඳුනා ගැනීම හා එම දුර්වලතා මඟ හරවා ගැනීමට ක්‍රියාමාර්ග හඳුනා ගැනීම.
3. ව්‍යාපාරික අවස්ථා හඳුනා ගැනීම හා එම අවස්ථා ව්‍යාපාරයේ සාර්ථකත්වයට යොදා ගැනීම.
4. ව්‍යාපාරයට බලපාන තර්ජන හඳුනා ගෙන ඒවා මඟහැර ව්‍යාපාරය ඉදිරියට ගෙන යාමට අවශ්‍ය පියවර ගැනීම. **(ල.04)**

v. මෙම පරිසර බලවේග වල හිතකර හෝ අහිතකර බලපෑම් විස්තර කර ගැලපෙන පරිදි ලියා ඇති පිළිතුරු වලට ලකුණු දෙන්න.(12 ශ්‍රේණිය ගුරු අත්පොත 38, 39 පිටු බලන්න.) **(ල.1x4=4)**

02) i. <u>ගණුදෙනුකරුවන්</u>
1. සාධාරණ වීම
2. හානි අවම වීම

<u>අයිතිකරුවන්</u>
1. සාධාරණ ඉපැයීමක් ලබා දීම
2. ආර්ථික ප්‍රතිලාබ අත්කර දීම

<u>සේවකයන්</u>
1. සමානාත්මතාව
2. මනා සේවක සම්බන්ධතා

<u>සමාජය</u>
1. රැකියා නියුක්තියට දායක වීම
2. බදු ගෙවීම නොපිරිහෙලා ඉටු කිරීම

**(ල.1x4=4)**

ii. පාසල තුල දී,
1. පාසලේ නීතිරීති වලට ගරු කිරීම
2. අනෙත් පාර්ශවයන්ට ගරු කිරීම
3. නායකත්වයට ගරු කිරීම
4. පාසලේ දේපල ආරක්ෂා කිරීම (ල.02)

පාසල පිටත දී,
1. පොදු දේපල ආරක්ෂා කිරීම
2. අනෙත් පාර්ශවයන්ට හිරිහැර නොවන පරිදි කටයුතු කිරීම
3. තමා සුරක්ෂිත වීමෙන් අන් අයගේ ආරක්ෂාව ද සැලකිලිමත් වීම
4. පරිසරයට හානි නොවන ලෙස කටයුතු කිරීම (ල.02)

iii. 1. යටිතල පහසුකම් සැපයීම - විදුලිය, මාර්ග නඩත්තුව, අපද්‍රව්‍ය ඉවත් කිරීම

2. දිරිගැන්වීම් ලබා දීම

3. ගණුදෙනුකරුවෙකු වීම

4. ප්‍රතිපත්ති සම්පාදනය කිරීම

(ඉහත කරුණු උදාහරණ සහිත ව පැහැදිළි කරන්න.) **(ල.04)**

iv. අ) අභ්‍යන්තර මිල ස්ථායීතාවය
- උද්ධමන පාලනය
- මිල මට්ටම ස්ථාවරව පවත්වා ගෙන යාම
- පොළී අනුපාතය පාලනය කිරීම **(ල.01)**

බාහිර මිල ස්ථායීතාවය
- විදේශ විනිමය අනුපාතය ස්ථාවර මට්ටමක පවත්වා ගැනීම **(ල.01)**

ආ) 1. ව්‍යාපාර ලියාපදිංචියට යොමු වීම
2. කීර්තිනාමය වර්ධනය වීම
3. රටේ සංවර්ධනයට දායක වීම
4. රජයේ හා මහජනතාවගේ පිළිගැනීමක් ලැබීම **(ල.02)**

v. අ) 1. ගුණාත්මක තත්ත්වයෙන් යුක්ත භාණ්ඩ සැපයීම නිසා පාරිභෝගික විශ්වාසය දිනා ගත හැකි වීම.
2. ව්‍යාපාරිකයාගේ පිරිවැටුම වැඩිවීම තුළින් ලාභය ඉහළ යාම.
3. ප්‍රමිතියට අනුව නිෂ්පාදනය කිරීම නිසා අපතය අඩු වීම.
4. අයහපත් තරග විරෝධී චර්යා නොමැති වීමෙන් යහපත් ව්‍යාපාර පරිසරයක් ඇති වීම.
**(ල.1/2x4=2)**

ආ) 1. තෝරා ගැනීමට ඇති අයිතිය
උදා -: එම පළතුරු පානයම මිල දී ගන්නා ලෙස තරුණයාට බල කිරීම.
2. තොරතුරු දැනගැනීමට ඇති අයිතිය
උදා -: පළතුරු පානයෙහි ලේබලය අපවිත්‍ර වී තිබීම හා අඩංගු ද්‍රව්‍ය ප්‍රමිතිය සඳහන් නොවීම.
3. ආරක්ෂාව සලසා ගැනීමේ අයිතිය
උදා -: ස්වාභාවික පළතුරු පානය වෙනුවට කෘතීම පළතුරු පානයක් ලබා දීම, ලේබලය අපවිත්‍ර වූ පළතුරු පානයක් ලබා දීම.
**(ල.02)**

03) i.

| නිර්ණායකය | කේවල ස්වාමී ව්‍යාපාර | හවුල් ව්‍යාපාර |
|---|---|---|
| i. සාමාජික සංඛ්‍යාව | එක පුද්ගලයෙකි | අවමය 02 උපරිමය 20 |
| ii. පරිපාලනය | අයිතිකරු විසින් සිදු කරයි | හවුල්කරුවන් විසින් සිදු කරයි |
| iii. තීරණ ගැනීම | ස්වාධීනව සිදු කරයි | සාමූහිකව තීරණ ගනියි |
| iv. විසුරුවා හැරීම | විසුරුවා හැරීමක් සිදු නොවේ. අභිමතය පරිදි ව්‍යාපාරය අවසන් කළ හැකිය | ස්වේච්ඡාවෙන් හෝ අධිකරණය මඟින් විසුරුවා හැරේ |

**(ල.1x4=4)**

ii. අ) 1. විශාල ප්‍රාග්ධනයක් සපයාගත හැකි වීම
2. වගකීම් සීමිත වීම
3. අඛන්ඩ පැවැත්මක් තිබීම
4. නෛතික පුද්ගලභාවයක් තිබීම **(ල.1/2x4=2)**

ආ) නොහැකිය. **(ල.01)**
හවුල විසුරුවා හැරිය යුතුය. තිදෙනා අතර ගිවිසුම වෙනුවට දෙදෙනා අතර නව හවුල් ගිවිසුමක් ඇති වී නව හවුල් ව්‍යාපාරයක් ස්ථාපිත කළ යුතුය. **(ල.01)**

iii. ● හවුල් ව්‍යාපාර **(ල.01)**

i. පැවැත්ම - අඛණ්ඩ පැවැත්මක් නොමැත
ii. බදු ගෙවීම - ව්‍යාපාරය නමින් බදු ගෙවිය නොහැක. අයිතිකරුවන් බදු ගෙවියයුතු ආදායම් සීමාව ඉක්මවා ඇත්නම් අයිතිකරුවන් තනි තනිව බදු ගෙවිය යුතුය
iii. ණයහිමියන් කෙරෙහි බැඳීම - අසීමිතව වගකිව යුතුය **(ල.1x3=3)**

iv. අ) 1. සිය වෙළෙඳ නාමය භාවිතයට අවසර දීම
2. කළමනාකරණ පුහුණුව ලබා දීම
3. අලෙවිකරණ සහය ලබා දීම
4. මූල්‍ය පහසුකම් ලබා දීම
5. වෙළෙඳ සැලේ නිමාව සකස් කර දීම
6. නිෂ්පාදිතය හෙවත් භාණ්ඩ හා උපකරණ සැපයීම
7. ශිල්පීය ඥානය ලබා දීම **(ල.1/2x4=2)**

ආ) 1. වරලත්ලාභියා පනවන කොන්දේසි අනුව කටයුතු කිරීමට එකඟ වීම
2. ප්‍රාග්ධනය ආයෝජනය කිරීම
3. වරලත්හිමියාගෙන් හෝ ඔහු විසින් නිර්දේශ කරන ලද සැපයුම්කරුවන්ගෙන් පමණක් භාණ්ඩ මිල දී ගැනීම
4. වරලත්හිමියාට ගිවසගත් පරිදි ගාස්තු ගෙවීම **(ල.1/2x4=2)**

v. 1. තීරණ ගැනීමේ නිදහස
2. මූල්‍ය/ ප්‍රාග්ධනය සපයා ගැනීමේ නිදහස
3. රාජ්‍ය අංශයේ මූල්‍ය රෙගුලාසි, පරිපාලන රෙගුලාසි වලින් නිදහස් වේ
4. දේශපාලන බලපෑම් අවම වීම
5. සේවක ප්‍රතිලාභ නම්‍යශීලීව ලබාදිය හැකිය. **(ල.04)**

04) i. ව්‍යවසායකත්වය තුළින් නවෝත්පාදන බිහි කරන බැවින් එය ජාතික නිෂ්පාදිතය ඉහළ නැංවීමට හේතු වේ. නව රැකියා අවස්ථා බිහිවීමෙන් සේවා නියුක්තිය ඉහළ යාම සිදුවන අතර ඔවුන්ගේ ආදායම් මට්ටම ඉහළ ගොස් ජීවන තත්ත්වය යහපත් අතට හැරෙනු ඇත. එසේම ඔවුන්ගේ ක්‍රය ශක්තිය ඉහළ යාම නිසා පාරිභෝජන රටාව ද වෙනස් වී භාණ්ඩ හා සේවා සඳහා ඉහළ ඉල්ලුමක් ඇති වේ. එවිට ව්‍යවසායකයන් තවදුරටත් පාරිභෝගික ඉල්ලුම සපුරාලීමට අවශ්‍ය නවෝත්පාදන වෙළෙඳපොළට ඉදිරිපත් කරයි. මෙසේ ව්‍යසායකත්වය තුළින් ආර්ථික සංවර්ධනය වේගවත් කළ හැකිය. **(ල.04)**

ii. අ)
1. වේගයෙන් වෙනස්වන පරිසරය තුළ සාර්ථකව ව්‍යාපාර කටයුතු මෙහෙයවීම සඳහා
2. රැකියා නිර්මාණය සඳහා
3. ආර්ථික සංවර්ධනය ඇති කිරීම සඳහා
4. ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීම සඳහා
5. තරඟකාරී ව්‍යාපාර අතර නවෝත්පාදන වල අවශ්‍යතාවය සඳහා **(ල.1/2x4=2)**

ආ)
1. ස්වයං ඇගයීම
2. පුහුණුව
3. අධ්‍යාපනය
4. අත්දැකීම් වලින් ඵල ලැබීම **(ල.1/2x4=2)**

iii. අ)
1. නව්‍යතා සොයා ගැනීම
2. සංකල්ප ගොඩනැගීම හා ව්‍යාපාර සැලැස්ම සැකසීම
3. අවශ්‍ය සම්පත් සම්පාදනය
4. යථාර්තයක් බවට පත් කිරීම
5. ප්‍රතිලාභ ලැබීම **(ල.02)**

ආ)
1. ව්‍යාපාර සම්බන්ධයෙන් රජයේ ප්‍රතිපත්ති සකස් කිරීමට
2. රැකියා අවස්ථා හඳුනා ගැනීමට
3. බදු දිරිගැන්වීම් ලබා දීමට
4. විවිධ ආයතන සපයන පහසුකම් ලබා දීම සහතික කර ගැනීමට **(ල.1/2x4=2)**

iv. අ)
1. මූල්‍යමය ගැටලු/ දුෂ්කරතා
2. තරඟකාරීත්වයට මුහුණදීමට අපහසු වීම
3. කළමනාකරණ දුර්වලතා
4. ව්‍යවසායකත්ව හැකියා අඩු වීම
5. යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම
6. තාක්ෂණික දැනුම ප්‍රමාණවත් නොවීම හා යාවත්කාලීන නොවීම **(ල.1/2x4=2)**

අ)
1. සර්වෝදය
2. ජයිකා (ජපන් අන්තර්ජාතික සහයෝගීතා සංවිධානය)
3. සණස (සකසුරුවම් හා ණයදෙන සමිති)
4. පෞද්ගලික බැංකු හා මූල්‍ය ආයතන
5. බදු වාර්තා සකස්කර දෙන පෞද්ගලික ආයතන **(ල.1/2x4=2)**

v. අ)

තාක්ෂණික - කාර්මික සංවර්ධන මණ්ඩලය
කාර්මික තාක්ෂණ ආයතනය

මූල්‍ය - ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය
ජාතික සංවර්ධන බැංකුව
ශ්‍රී ලංකා සුළු හා මධ්‍ය පරිමාන කර්මාන්ත මණ්ඩලය

අලෙවි - අපනයන සංවර්ධන මණ්ඩලය

උපදේශන - අපනයන සංවර්ධන මණ්ඩලය
ශ්‍රී ලංකා ප්‍රමිත ආයතනය **(ල.02)**

ඇ) 1. තම හැකියා හා කුසලතා පිළිබඳ ව අධ්‍යයනය කිරීම හා ඇගයීම
2. නිෂ්පාදිතයට ඇති වෙළෙඳපොළ හා එම වෙළෙඳපොළට ළඟාවිය හැකි ද යන්න
3. ආරම්භක ප්‍රාග්ධනය හා අවශ්‍ය කාරක ප්‍රාග්ධනය පිළිබඳ ව අධ්‍යයනය කිරීම
4. ව්‍යාපාර සංවිධාන ක්‍රමය පිළිබඳ ව අධ්‍යයනය
5. ව්‍යාපාර සංවිධාන ක්‍රමය හා පවතින නීතිරීති
6. පවතින තරගකාරීත්වය **(ල.02)**

05) i. අ) 1. පොදු පිළිගැනීමක් පැවතීම
2. කල් පැවැත්මක් තිබීම
3. අනුකරණයේ දුශ්කරතා
4. පහසුවෙන් ගෙන යා හැකි බව
5. පහසුවෙන් හඳුනාගත හැකි වීම හෙවත් සමජාතීය බව
6. කුඩා කොටස් වලට බෙදිය හැකි බව **(ල.1/2x4=2)**

ආ) 1. විනිමය මාධ්‍යක් ලෙස කටයුතු කිරීම
2. වටිනාකම මැනීමේ මිණුම් දණ්ඩක් ලෙස කටයුතු කිරීම
3. වටිනාකමේ සන්නිධියක් ලෙස කටයුතු කිරීම
4. විලම්බිත ගෙවුම් මාධ්‍යක් ලෙස කටයුතු කිරීම **(ල.1/2x4=2)**

ii. අ) බලපත්‍රලාභී වාණිජ බැංකු ජංගම ගිණුම් පවත්වා ගෙන යාම හා මුදල් මැවීමේ හැකියාව ඇති මූල්‍ය ආයතන විශේෂයකි. බලපත්‍රලාභී විශේෂිත බැංකු වලට ජංගම ගිණුම් පවත්වා ගෙන යාමට හැකියාව නොමැත. **(ල.02)**

ආ) <u>ලියාපදිංචි මූල්‍ය සමාගම්</u>
1. කුලීපිට ගැනුම් පහසුකම්
2. දේපල හා ඉඩම් වෙළෙඳාම
3. කල්බදු මූල්‍යකරණය
4. කෙටි කාලීන ණය සැපයීම
5. රජයේ සුරකුම් පත්වල ආයෝජනය
6. කාලීන තැන්පතු භාර ගැනීම **(ල.1/2x2=1)**

<u>බලපත්‍රලාභී විශේෂිත බැංකු</u>
1. කාලින හා ඉතිරිකිරීමේ තැන්පතුභාර ගැනීම
2. විවිධ ක්ෂේත්‍රවල ව්‍යවසායකයින්ට ණය සැපයීම
3. සමාගම් වල කොටස් ප්‍රාරක්ෂණ කටයුතු කිරීම
4. කල්බදු පහසුකම් සැපයීම
5. කළමනාකරණ උපදේශන සේවා සැපයීම **(ල.1/2x2=1)**

iii. අ) ඒකකභාරයක් යනු ආයෝජකයින්ම ඒකක විකිණීමෙන් රැස්කර ගන්නා මුදල් වලින් සමන්විත ආයෝජන අරමුදලකි. මෙහි රැස් කර ගත් මුදල් වෘත්තීය අරමුදල් කළමනාකරුවන් විසින් ආයෝජන කළඹක යොදවනු ලැබේ. එහි ප්‍රතිලාභ ඒකකභාරයේ ඒකක මිල දී ගත් ආයෝජකයන් අතරේ බෙදා හරිනු ලැබේ. **(ල.01)**
එයට සම්බන්ධ පාර්ශව,

- ඒකක භාරකරු
- අරමුදල් කළමනාකරණ සමාගම්
- ඒකක හිමියන් හෙවත් ආයෝජකයින් **(ල.01)**

ආ) 1. රක්ෂණ සමාගම්
2. සේවක අර්ථසාධක අරමුදල
3. සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල
4. අනුමත විශ්‍රම අරමුදල්
5. රාජ්‍ය සේවා විශ්‍රම අරමුදල් **(ල.02)**

iv. අ) 1. මුදල් ප්‍රතිපත්තිය මෙහෙය වීම
2. විනිමය අනුපාත ප්‍රතිපත්තිය මෙහෙය වීම
3. ශ්‍රී ලංකාවේ නිල විදේශ සංචිත කළමනාකරණය
4. ව්‍යවහාර මුදල් නිකුත් කිරීම හා බෙදා හැරීම
5. බැංකු හා බැංකු නොවන ආයතන වල අධීක්ෂක ලෙස කටයුතු කිරීම
(ගුරු අත්පොත 12 ශ්‍රේණිය 145 පිටුව) **(ල.02)**

ආ) 1. ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය (SLIPS)
2. ජගත් අන්තර් බැංකු මූල්‍ය විද්‍යුත් සන්නිවේදන ජාලය (SWIFT)
3. තත්කාලීන දළ පියවීම් පද්ධතිය (RTGS)
4. ලේඛන රහිත සුරැකුම් තැන්පතු පද්ධතිය (SSDS) **(ල.02)**

v. 1. ජංගම තැන්පතු
2. ඉතිරි කිරීමේ තැන්පතු
3. ස්ථාවර තැන්පතු
නම් කිරීමට **(ල.01)**
විස්තර කිරීමට **(ල.1x3=3)**


LOL.lk
Learn Ordinary Level
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර
G.C.E. O/L
විද්‍යාව
A9+
ඉංග්‍රීසි භාෂාව
ENGLISH LANGUAGE
සිංහල
G.C.E. O/L SINHALA
General English
• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams
සමනල දැනුම
විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank
Master Guide
WWW.LOL.LK
CASH ON DELIVERY
HOME DELIVERY
Whatsapp contact
+94 71 777 4440
Website
www.lol.lk
Order via WhatsApp
071 777 4440